## එස්.ජී.ජේ. පතිරණ එ. අනුරාධපුර මහා නගර සභාව

RTIC Appeal 586/2018 - 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය සහ රීති අංක 30 ප්‍රකාරව යොමු කරන ලද ඉවත් කර ගැනීමේ අයදුම්පත්‍රය -2019.11.14 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලදී

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සමාජික** - පුංචිහේවා .ෂ්ඨ නීතීඥ ඒස්ජෙය
**කොමිෂන් සභා සමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික** - විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - **එස්.ජී.ජේ. පතිරණ**
**නොතිසි ලත් පාර්ශවය-** නම් කළ නිලධාරී, අනුරාධපුර මහා නගර සභාව

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.04.09 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 2018.05.01 |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කල දිනය | 2018.05.09 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නොමැත |
| කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කල දිනය | 2018.07.02 |

### අභියාචනයට පසුබිම්වු කරුණු

අභියාචක 2018.04.09 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශයේ තුන් වන පියවර පෙදෙසෙහි මිනින්දෝරු සැලසුම් සහ ඉදිකිරීම් සැලසුම් ඉල්ලුම් පත්‍ර පරීක්ෂාවට බලය පවරා ඇති නිළධාරියා කව්ද ?

2. තුන්වන පියවරට අමතරව සැළසුම් පත්‍ර ප්‍රදේශයක් පරීක්ෂාවට වෙනත් බල ප්‍රදේශයක් පවරා ඇතිද ? ඒ කවර ප්‍රදේශ ද ?

3. ඉහත අංක 1 සහ 2 සදහා බලය පවරා ඇත්තේ කෙදින සිටද ? බලය පැවරීමේ ලිපියේ පිටපතක් ලබා දෙන්න

4. බලය පවරන ලද දිනයේ සිට 2018.04.01 දින දක්වා එම නිළධාරියා විසින් පරීක්ෂණ වාර්තා ලබා දී ඇති මිනින්දෝරු සැලසුම් පත් සහ ඉදිකිරීම් සැලසුම් පත් ඉල්ලුම් පත්‍ර හා අදාළ ලිපිගොනු පරීක්ෂාවට හා අවශ්‍ය සටහන් ලබා ගැනීමට ලබා දෙන්න.

5. අනුරාධපුර මහා නගර සභාව විසින් ඉහත බල ප්‍රදේශයන්හි මාර්ග වලට අදාලව පනවන ලද ගොඩනැගිලි සීමා හා වීථි රේඛා අඩංගු ගැසට් පත්‍රයේ අදාළ කොටස් පිටපතක් ලබා දෙන්න.

6. මිනින්දෝරු සැළසුම අනුමත කිරීම සඳහා වීථි රේඛා සීමාව තුළ පවතින මායිම් තාප්ප ඉවත් කළ යුතු යැයි ගන්නා ලද සභා සම්මතයේ පිටපතක්, සැලසුම් කමිටු තීරණ යේ පිටපතක් ලබා දෙන්න. සැලසුම් කමිටු තීරණ පොත පරීක්ෂාවට ලබා දෙන්න.

තොරතුරු නිලධාරියා 2018.05.01 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ පනතේ 5(1)(2)(අ) උප වගන්තිය පරිදි පුද්ගලික තොරතුරු වලට අදාළ තොරතුරු බැවින් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018.05.09 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.02 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගත වූ කරුණු

දිනැති ලිපිය මගින්, තම අභියාචනය ඉවත් කර ගැනීමට තීරණය කර ඇති බවට, අභියාචක කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(1) පහත පරිදි වේ.

*අභියාචනයක් විභාග වෙමින් පවතින විට අභියාචකට ඕනෑම අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත ලිඛිතව හේතු දක්වා, ඔහු/ඇය විසින්ම අත්සන් කර, අනෙක් පාර්ශවය/න් වෙත ලබාදීම සඳහා පිටපතක් ද සමග ඉදිරිපත් කිරීම මගින් සිය අභියාචනය ඉවත් කර ගැනීමට හැකි අතර, කොමිෂන් සභාව අනතුරුව සියලූ පාර්ශවයන්ට මෙකී අභියාචනය ඉවත් කර ගැනීම පිළිබඳ දැනුම්දීම ලබාදෙනු ඇත.*

රීති අංක 30(3) පහත පරිදි වේ.

*ඉහත උප රීති (1) සහ (2) හි සඳහන් කරන හේතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තෘප්ත වේ නම්, අභියාචනය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු ඇත.*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(3) ප්‍රකාරව, ලබාදී ඇති හේතුන් වලින් කොමිෂන් සභාව සෑහීමකට පත්වී ඇති බැවින් අභියාචනය ඉවත් කර ගැනීමට අවසර දෙනු ලැබේ.

*****

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.